(10)

00479

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

විද්‍යාවේදී උපාධි පාඨමාලාව - තුන්වන මට්ටම

අවසාන විභාගය - 2016/2017

LWU 1161 - නීතිය පිලිබඳ අවබෝධය සහ සංකල්ප

කාලය - පැය (02)

---

දිනය - **2017** අගෝස්තු **08** වන දා　　　　　　　　වේලාව - ප.ව. **1.00-3.00**

---

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිලිතුරු සපයන්න.**

**අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

01. (අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ඉතිහාසය පිලිබඳ කථාවක් පැවැත්වීමට ඔබට නියම වී තිබේ. 1972 හා 1978 වර්ෂවල සම්මත වූ පලමු හා දෙවන ජනරජ ව්‍යවස්ථා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කථාව සඳහා කෙටුම්පතක් සකස් කරන්න.

(ලකුණු 10)

(ආ) 'පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය' නමැති සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ඇ) නීතියේ ආධිපත්‍යය පිලිබඳ මහාචාර්ය ඩයිසිගේ නිර්වචනය සඳහන් කරන්න. (ලකුණු 05)

(මුලු ලකුණු = 20)

02. (අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන ඕනෑම මූලික අයිතිවාසිකම් තුනක් (3) තෝරාගෙන ඒ එක් එක් අයිතිවාසිකම පිලිබඳ සාරාංශගත පැහැදිලි කිරීමක් සපයන්න. ඔබගේ පැහැදිලි කිරීම තුල ප්‍රායෝගික උදාහරණවලට අවධානය යොමු කල යුතු බවට අපේක්ෂා කෙරේ.

(ලකුණු 15)

(ආ) X නම් වූ ගම්මානයේ ජීවත් වූ සතර හැවිරිදි දැරියක මරා දමා තිබිය දී ඇයගේ මළ සිරුර සොයාගනු ලැබූ අතර පසුව අනාවරණය වූයේ ඝාතනය කිරීමට පෙර ඇයව ලිංගික වශයෙන් අපයෝජනයට ලක්කොට තිබුණු බවයි. මෙම ඝාතනයට සැක පිට එම ප්‍රදේශයේ පදිංචි විසි හය හැවිරිදි තරුණයෙක් වූ රන්ජන්ව පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදී. අත්අඩංගුවේ සිටියදී, පොලිසිය ඝාතනයට වරදකරු ලෙස පිලිගනිමින් පාපොච්චාරණයක් කරන ලෙස බල කොට රන්ජන්ට දරුණු ලෙස වධහිංසා පැමිණවිය. මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධ සාර්ථක නඩුකරයක් ගොනු කිරීමට රන්ජන්ට හැකිද? සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුලු ලකුණු = 25)

03. (අ) ශ්‍රී ලංකාවේ විවිධ නීති පද්ධති මොනවා දැයි ලැයිස්තුගත කරන්න. (ලකුණු 5)

(ආ) ඔබ ඉහත (අ) හිදී හදුනාගත් නීති පද්ධති දෙකක් පිලිබද පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ඇ) 'ප්‍රාදේශීය නීතිය' හා 'පුද්ගල නීතිය' අතර වෙනස කුමක්ද? ශ්‍රී ලංකාවේ නීති පද්ධතිවලින් උදාහරණ සපයමින් ඔබගේ පිලිතුර තහවුරු කල යුතුය. (ලකුණු 10)

(ලකුණු = 25)

04. (අ) වලංගු අර්පණයක් ඇති වීම සදහා සම්පූර්ණ විය යුතු අවශ්‍යතා මොනවාදැයි පහදන්න. එදිනෙදා ජීවිතයේ උදාහරණවලින් ඔබගේ පැහැදිලි කිරීම සමන්විත විය යුතුය. (ලකුණු 15)

(ආ) පහත අවස්ථාවල දී වලංගු ගිවිසුමක් ඇති වී තිබේදැයි සාකච්ඡා කරන්න.

I. මාලතී නාලකගේ භාර්යාවය. විවාහයෙන් පසු මුල් දවස්වල ඇදුම් හා විසිතුරු දෑ මිල දී ගැනීම සදහා මාසිකව රුපියල් 5000 බැගින් සෑම මසකම තමා මාලතීට සපයන බවට නාලක ඇයට පොරොන්දු වූයේය. මුල් මාස කිහිපය තුල නාලක මේ ප්‍රතිඥාව ඉටු කලේය.

එහෙත් පසුව දෙපල අතර විවිධ මත ගැටුම් ඇති වූ අතර විවාහය අසතුටුදායක තත්වයට පත්විය. ඒ සමග නාලක සිය පොරොන්දුව ඉටු කිරීම ප්‍රතික්ෂේප කලේය. ගිවිසුම කඩකිරීම සම්බන්ධයෙන් නාලකට එරෙහිව නඩු පැවරීමට මාලතී අපේක්ෂා කරයි.

(ලකුණු 5)

II. චම්පා පාසල් ගුරුවරියක වන අතර ඇය පාසලට යන්නේ බස් රථයෙනි. වේලු ත්‍රී රෝද රථ රියැදුරෙකි. ඔහුගේ දියණිය ඉගෙනුම ලබන්නේ චම්පා උගන්වන පාසලේය. තමා සිය දියණිය දිනපතා ත්‍රී රෝද රථයේ පාසල් ගෙන යන නිසා තමාට සෑම දිනකම චම්පාට ද ගමන් පහසුකම් සැලසිය හැකි බවට වේලු චම්පාට යෝජනා කරයි. ඒ සදහා ගෙවීමක් අවශ්‍ය දැයි විමසූ විට චම්පාට වේලු පැවසුයේ තමා මේ ක්‍රියාව කරන්නේ සිය දියණියගේ ගුරුතුමිය කෙරෙහි තිබෙන ගරුත්වය නිසා වන බැවින් තමාට ගෙවීමක් අනවශ්‍ය බවයි. චම්පා ඔහුගේ යෝජනාව පිලිගනී. (ලකුණු 5)

(මුලු ලකුණු =25)

05. (අ) ගිවිසුම් ශක්නුතාවය කෙරෙහි බලපාන සාධක මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ආ) කොන්දේසියක් සහ ප්‍රතිඥාභාරයක් (වොරන්ටියක්) අතර වෙනස කුමක්ද? (ලකුණු 05)

(ඇ) වලංගු වගකීමෙන් බැහැර කිරීමේ වගන්තියක් සදහා සම්පූර්ණ විය යුතු අවශ්‍යතා මොනවාද? (ලකුණු 05)

(ඇ) ගිවිසුමක ප්‍රකාශිත නියම හා අනුමිත නියම අතර වෙනස දක්වන්න.

(ලකුණු 5)

(මුළු ලකුණු = 25)

06. පහත අවස්ථා විසින් ඇති කරන නෛතික ප්‍රතිඵල මොනවාදැයි සාකච්ඡා කරන්න.

(අ) තම අනුගාමිකයන් තමා කෙරෙහි තිබෙන භක්තිය නිසා ඕනෑම දෙයක් කරනු ඇතැයි දන්නා පූජකවරයෙක් තම අනුගාමිකාවක වන වයස්ගත කාන්තාවකට ඇයගේ අවසාන කැමති පත්‍රය තම වාසිය පිණිස ලියන ලෙස පෙළඹවීම් කරයි.

(ආ) තම නිවස රුපියල් මිලියන දෙකකට වන්නට විකුණනු පිණිස නිලූපුලී ඔහු සමග එකගතාවයකට එළැඹුණාය. එකගතාවයට එළඹෙන විට චන්න සිතුවේ නිලූපුලී විකිණීමට අදහස් කරන්නේ කැස්බෑවේ පිහිටි ඇයගේ නිවෙස බවයි. එහෙත් ඇත්තටම ඇය විකිණීමට අදහස් කලේ රාජගිරියේ පිහිටි ඇයගේ නිවසකි.

(ඇ) රුවන්ගේ සහයෝගය තම ව්‍යාපාරය වෙත ලබාගැනීම සඳහා ලක්ෂාන් රුවන් සමග එකගතාවයක් ඇති කරගනී. ලක්ෂාන් නියුක්ත 'ව්‍යාපාරය' මත්ද්‍රව්‍ය අලෙවිය වන අතර මහා පරිමාණ හෙරොයින් ජාවාරමක් ද ඊට ඇතුලත්ය. තමාට ලබාදෙන සහයෝගය සඳහා මාස්පතා ගෙවීමක් රුවන්ට කිරීමට ලක්ෂාන් එකග වේ.

(ඉ) තමාට මාසිකව රුපියල් 5000 ක මුදලක් ලබා දිය යුතු බවත් තම හිටපු පෙම්වතිය වන ප්‍රමිලාට පවසන මයුරන් එසේ නොකලහොත් තම දෙපලගේ පුද්ගලික ඡායාරූප මුදාහරින බවට ඇයට තර්ජනය කරයි. එම තර්ජනය නිසා බියට පත්වන ප්‍රමිලා ඔහුගේ ඉල්ලීමට අවනත වේ.

(ඊ) සිය ජංගම දුරකථනයේ අන්තර්ජාලයට පිවිසීමේ පහසුකම් තිබෙන බවට ප්‍රකාශ කරමින් ප්‍රතිභා තමන්ගේ ජංගම දුරකථනය කාර්තික්ට අලෙවි කරයි. කෙසේ වූවද දුරකථනය ලැබුණු පසු කාර්තික්ට පෙනී ගියේ ප්‍රතිභාගේ ප්‍රකාශය සාවද්‍ය බවත් ඇය සිතා මතා තමාව නොමග යවා ඇති බවත්ය.

(මුළු ලකුණු 5 X 5 =25)

07. (අ) ගිවිසුමක් අවසන් විය හැකි විවිධ ආකාර කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 15)

(ආ) ගිවිසුමක් කඩකිරීම සම්බන්ධයෙන් පවතින ප්‍රතිකර්ම මොනවාද? (ලකුණු 10)

(මුළු ලකුණු = 25)

08. (අ) විවිධ සේවා ගිවිසුම් (රැකියා ගිවිසුම්) වර්ග මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(ආ) සේවා ගිවිසුමක් සහ සේවය සැපයීම සඳහා වූ ගිවිසුමක් අතර වෙනස නීතිය මගින් නිර්ණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු = 25)

***හිමිකම් ඇවිරිණි***